# මලිතිගේ අකුරු පොත



දිනාරා සෙතුලි ආරියවංශ

# මලිතිගේ අකුරු පොත

**දිනාරා සෙතුලි ආරියවංශ**

කතෘ

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
6 ශ්‍රේණිය G
2026

ප්‍රකාශිත දිනය 2026-05-10

**ISBN 978-624-211-488-0**

# ~ පිදුම ~

මහනුවර මහාමායා බාලිකා විදුහලේ ශශිකලා සේනාධීර විදුහල්පතිතුමියටත්, ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක, සෙනෙවිරත්න මහලේකම් සර්ටත්,

6-G පංතියේ පංතිභාර ගුරුතුමියටත්, අංශභාර ගුරුතුමියටත් මාගේ දෙමාපියන්ටත් මෙම අවස්ථාව ලබා දීම සහ මගපෙන්වීම වෙනුවෙන්

ගෞරවනීය ස්තූතිය.

අකුරු කියාදුන් සියලුම ගුරුවරුන්ට යහළුවන්ට නෑදෑයින්ට මේ කුඩා උත්සාහයට ආදරයෙන් පිදේ..



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර,

විදුහල්පතිනිය,

මහාමායා බාලිකා විද්‍යාලය.

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.


සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව



පොඩි ගමක
පන්සල ළඟ
පුංචි පොත්
කඩයක්
තිබ්බා.

ඒ කඩේ
අයිතිකාරයා
මාරසිංහ
අංකල්.
කවුරුත් කීවේ
"මාරේ
මාමා...මාරේ
අංකල්"
කියලා...

එයාගේ කඩේ තිබ්බේ එකම එක පොතයි. හම ගැලවිලා, කොළ කහ වෙලා තියෙන පරණ පොතක්.

දවසක් මලිති එයාගේ තාත්තා එක්ක කඩේට ආවා.මාරේ අංකල් .

"අංකල්, මේ පොත කීයද?"

"සල්ලි ඕන නෑ පුතේ. හැබැයි එක කොන්දේසියක්. රෑ 12ට පස්සේ මේ පොත ඇරලා බලන්න එපා."

මලිති හිනා වෙලා පොත අරන් ගියා. ඒක මේස උඩ තියලා යන එන ගමනට ඒ දිහා බැලුවා...

එදා රෑ වෙනකම් මලිති නොයිවසිල්ලෙන් හිටියේ... ඔරලෝසුවේ රෑ 12 නාද උනා....

රෑ 12.05 ට එයාට ඉවසන්න බැරි වුණා. පොත ඇරියා.

එතකොට... පුංචි ආලෝකයක් ආවා!

පොතේ ඇතුලේ තිබ්බේ සාමාන්‍ය අකුරු නෙවෙයි. හැම අකුරටම පොඩි ඇස් දෙකක්, කටක්, අතපය තිබ්බා!



"අපිව නිදහස් කළා!" කියලා අකුරු පැන පැන නැටුවා. එයා තමයි ලොකු අයියා.

"මම මහා රජෙක් ගැන කතාවක් දන්නවා!" කියලා 'ම' අකුර උඩ පැනලා කෑ ගැහුවා. එයා තමයි කතාකාරයා.



"මාව පාවිච්චි කරලා 'අම්මා' කියන වචනේ හදන්න!" කියලා 'ම්' අකුර ලැජ්ජාවෙන් කිව්වා.

'ක' අකුර ඇවිත් කිව්වා, "මම නැති නම් 'කිරි' කියන්න බැහැ. ළමයි බඩගින්නේ ඉන්නවා!"

'න' අකුර කිව්වා, මම නැති නම් 'නිදාගන්න' බැහැ. හැමෝම ඇහැරන් ඉන්න ඕනද?"

ඒ වගේම 'ස' අකුර කිව්වා, "මම තමයි සතුට! මාව නැති නම් කවුරුත් හිනා වෙන්නේ නෑ."

මලිති බය වුණා. "ඇයි ඔයාලා මේ වගේ ජීවත්වෙන්නේ?"

එතකොට 'අ' අකුර කිව්වා,

"මේ පොත ලිව්වේ පැරණි ලේඛකයෙක්. එයා මැරෙන්න කලින් කිව්වා, 'මගේ කතා වලට ඇහුම්කන් දෙන්න පුළුවන් පිරිසිදු හිතක් තියෙන කෙනෙක්ට විතරයි කියලා. අපි ජීවත් වෙනවා කියලා දැනෙන තරමේ සතුටක් අපට අද දැනෙන්නේ. අද ඔයා අපේ අලුත් යාළුවා!"

එදා ඉඳලා හැම රෑකම මලිති පොත ඇරියා. අකුරු එයාට කතා කිව්වා.

- 'ර' අකුර කිව්වා රජ කෙනෙක් ගැන කතාවක්.

- 'ය' අකුර කිව්වා යක්ෂයෙක් බයට දුවපු කතාවක්.



- 'හ' අකුර කිව්වා හිනා යන හාවෙක්ගේ කතාවක්.

මේ අයුරින් මලිති මේ පොතත් සමග ටිකෙන් ටික ලොකු උනා. තරග විභාග ක්‍රීඩා තරග ආදී සියල්ලම එක්ව මලිති ගේ ජීවිතය ලස්සනට ගලාගෙන ගියා.

වසර 20ක් ගියා. මලිති දැන් විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරියක්. කුඩා අවධියේ සිටම පොත් පත් කියවීම නැඹුරු වී සිටි ඇය දැන් ලොකු ලේඛිකාවක්.

එයාගේ පොත් වලට රටම ආදරේ  කරනවා. මිනිස්සු අහනවා, "මැඩම් ඔයාට මෙච්චර අමුතු අදහස් එන්නේ කොහෙන්ද?" කියලා.

මලිති හිනාවෙලා කියනවා, "මගේ පොතේ අකුරු තාමත් රෑට මට කතා කරනවා. මම නින්දට යනකොට 'හෙටත් කතාවක් කියන්නම්' කියලා 'හ' අකුර මට කියලා යනවා."

"අකුරු කියන්නේ අප ජීවිතේ. හැබැයි අපි ඒවා හරියට පාවිච්චි කරොත්, ඒවා කතා හදනවා, හිනා හදනවා, ලෝකය වෙනස් කරනවා, අපව හැමදාම සතුටින් තියනවා. "

එයාගේ ඒ කතාවට හැමෝම එකග වුනා..

"අපි නොදන්නවා උනාට අකුරු නැත්නම් වචනත් නෑ." මලිති කීවා.



පිට රට සිටි මලිති වසර 10කට පස්සේ නිවසට ආවා.

ඒ ඇගේ පොතට හිමි ජාතික සම්මානය ගැනීමට... ඇය වේදිකාවට ගියේ පරණ පොතත් අරගන..

මලිති අඬනවා. පොතෙන් 'ස' අකුර විතරක් එළියට ඇවිත් එයාගේ කම්මුල අල්ලනවා. වටේ අකුරු ටික "නැගිටින්න" කියලා අත් දික් කරන් ඉන්නවා.

"පොතකින් ජය ගන්න බෑ කියලා හිතුවා. හැබැයි පොතේ අකුරු එක්ක යාළු වුනාට පස්සේ, ජීවිතේ කියන ලොකුම පොතම මම දින්නා."

මලිති වේදිකාවේ ඉඳන් හැමෝටම කීවා....

පොඩි කාලේ මමත් හිතුවේ අකුරු කියන්නේ කඩදාසි උඩ කළු ඉරි කෑලි ටිකක් කියලා.

හැබැයි රෑ 12.05 ට මගේ පරණ පොත ඇරුණු දා... මම තේරුම් ගත්තා.

'අ' අකුර කියන්නේ ලොකු අයියා. හැම වචනයකම පටන් ගැන්ම එයා. එයා නැති නම් "අම්මා" කියන්න බෑ, "ආදරේ" කියන්න බෑ. පටන් ගන්න නිර්භයකම එයාගෙන්.

'ක' ඉඳන් 'ඥ' වෙනකම් හැම අකුරම එක වැඩේට.

'ක' අකුර කිරි වගේ - අපේ බඩගින්න නිවනවා.

'න' අකුර නිදි වගේ - අපේ මහන්සිය නිවනවා.

'ස' අකුර සතුට වගේ - අපේ හිත නිවනවා.

අකුරු කියන්නේ යාළුවෝ පුතේ.

ඔයා තනියම ඉන්නකොට, ඔයා අඬනකොට, ඔයා හිනා වෙනකොට... වචන 60ම ඔයා එක්ක ඉන්නවා.

මම ලියපු හැම පොතකම, කියපු හැම කතාවකම ඇත්තටම කතා කරන්නේ මම නෙවෙයි. මාත් එක්ක හිටපු මේ අකුරු යාළුවෝ.

ඉතින් ඔයා අකුරු එක්ක රණ්ඩු වෙන්න එපා. A, B, C, අ, ආ, ක, ග... හැම කෙනාටම කතා කරන්න. "අද මට මොන කතාවද කියන්නේ?" කියලා අහන්න. එහෙම අහපු දවසට, ඔයාගේ ජීවිතේ කියන පොතත් පණ එනවා.

"කතාව ඉවර වෙන්නේ නෑ. අකුරු ඉවර වෙන්නේත් නෑ. ඔයාගේ සිහිනත් ඉවර වෙන්නේත් නෑ. ඔයාලාගේ අනාගතයට සුභපැතුම්". මලිති කතාව අවසන් කලා. මුලු සභාවම අත්පොලසන් දුන්නා.

**නිමි**



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ)

**ISBN 978-624-211-488-0**